# ECHO OF HIS CALL

# කැඳවීමේ ප්‍රතිරාවය

SINHALA

ECHO OF HIS CALL 1969-2019 GOLDEN JUBILEE (ECHO GROUP)

India's National Spiritual Newspaper

₹ 10/-

Published monthly in ENGLISH, TAMIL, MALAYALAM, TELUGU, HINDI, KANNADA, MARATHI, BENGALI, GUJARATI, ODIYA, ASSAMESE, PUNJABI, NEPALI, URDU, SINHALA & AFRIKAN

Editor : S. SAM SELVA RAJ

16 Languages

Vol. XVI | YEAR OF OUR LORD JESUS CHRIST, AUGUST 2022 | Issue No. 9


## ශුද්ධවූ බයිබලය

**(ගීතාවලිය 107:31-41**

31. ස්වාමින්ගේ යහපත්කම හා මනුෂ්‍ය පුත්‍රයන්ට කරන පුදුම ක්‍රියා ගැන මනුෂ්‍යයෝ උන්වහන්සේට ස්තුති කෙරෙත්වා.

32. ඔව්හු ජන සමාගමේදී උන්වහන්සේ උසස් කරමින් වැඩිමහල්ලන්ගේ ආසනයේදී උන්වහන්සේට ප්‍රශංසා කෙරෙත්වා.

33. උන්වහන්සේ ගංගා කාන්තාරයක්ද දිය උල්පත් වියළි බිමක්ද කරන සේක.

34. වැසියන්ගේ දුෂ්ඨකම නිසා සාර වූ දේශය ලවණ කාන්තාරයක් කරන සේක.

35. උන්වහන්සේ කාන්තාරයක් දිය පොකුණක්ද වියළි බිමක් දිය උල්පත් ද කරන සේක.

36. බඩගිනි වූවන් විසින් වාසයට යෝග්‍ය වී නුවරක් සාදන පිණිසත් කෙත් වපුරා, මිදි වතු වවා

37. ඵල ලබාගන්නා පිණිසත්, ඔවුන් එහි වාසය කරවනසේක.

38. ඔවුන් අතිශයින් බෝවන ලෙස උන්වහන්සේ ඔවුන්ට ආශිර්වාද කරන සේක. ඔවුන්ගේ සිව්පාවුන් අඩු වෙන්ට නොදෙන සේක.

49. ඉන්පසු ඔවුන් පීඩා, විපත්ති හා දුක් නිසා අඩු වී පහත් කරනු ලබති.

40. උන්වහ්නසේ අධිපතීන් කෙරෙහි නින්දා වගුරුවා, මං නැති පාළු තැන්වල මුලාව යන්ට සලස්වන සේක.

41. එහෙත් උන්වහන්සේ දිළිඳා පීඩාවෙන් මුදා උසස් කොට, බැටළු රැළක් මෙන් ඔහුගෙන් පවුල් උපදවන සේක.

# දෙවියන්වහන්සේගේ දරුවන්ගේ සැබෑ අනන්‍යතාවය

# THE IDENTITIES OF TRUE CHILDREN OF GOD!

**Pr. S. Sam Selva Raj**

*''උන්වහන්සේ ඔහුට කථා කොට, මම වනාහී මේ දේශය උරුමකරගන්ට නුඹට දෙන පිණිස ඌර් නම් වූ කල්දිවරුන්ගේ නුවරින් නුඹ ගෙනාවූ ස්වාමින්වහන්සේ යයි ඔහුට කී සේක.''*

*ඔහු ද, ස්වාමි වූ දෙවියන්වහන්සේ ඒක මට උරුම වෙන බව කුමක් දැනගනිම්දැයි කීය.''*

*උන්වහන්සේ ඔහුට කතා කොට තුන් අවුරුදු ගොන් නැම්බියෙකුත් කොබෙයියෙකුත් , පරෙවි පැටවෙකුත් මට ගෙනෙන්නැයි කීසේක.''*

*ඔහු ඒ සියල්ලන් ගෙනවිත් උන් දෙපළකොට පළුවක් ඉදිරිපිට අනික් පළුව බැගින් තැබීය. එහෙත් ඔහු පක්ෂීන් දෙපළු කලේ නැත.''*

*ගිජු පක්ෂීහු වනාහී මළකුණු පිටට බැස්සෝය.*

*ආබ්‍රහම් උන් එළෙව්වෝය. ඉර බස්නා කළ බරවූ නින්දක් ආබ්‍රහම් කෙරෙහි පැමිණුණෝය. බලව, භයංකර කමක් ද මහත් අන්ධකාරයක් ද ඔහු කරා පහළ විය.*

*උන්වහන්සේ ආබ්‍රහම්ට කථා කොට, නුඹේ වංශය තමන්ට අයිති නැති දේශයෙක්හි විදේශීවන බවද ඔවුන්ම මෙහෙකරන බවද ඔවුන් අවුරුදු හාරසිය ඔවුන්ට පීඩා කරන බවද සැබැවින්ම දැනගනින්න.''*

*තවද ඔවුන් මෙහෙකරන්නාවූ ඒ ජාතිය මම විනිශ්චය කරන්නෙන්නම්, ඉන්පසු ඔවුහු බොහෝ සම්පත් ඇතුව පිටත්ව එන්නෝය.'' (උත්පත්ති 15:7-14)*

*''මෙසේ ආබ්‍රහම් දෙවියන්හන්සේ විශ්වාස කළේය. එය ඔහුට ධර්මිශ්ඨකම කොට ගණන් ගනු ලැබුවේය.'' (ගලාති 3:6)*දෙවියන්වන්සේ ආබ්‍රහම්ට දුන් පොරොන්දුව වසර 430 කට පසුව ඔහුගේ පරම්පරාවට සම්පූර්ණ විය. පොරොන්දුව දුන් තැනැත්තා විශ්වාසවන්තය. උන්වහන්සේ එය ඒ ආකාරයෙන්ම ඉටු කරයි. අප දෙවියන්වහන්සේ කල විට එය අපට ධර්මිෂ්ඨකම වන්නේය.

3 වෙනි පිටුවට ...

ECHO OF HIS CALL - (1969-2019 GOLDEN JUBILEE YEAR)


(ECHO GROUP)



*from your dearly beloved brother...*

# කැඳවීමේ ප්‍රතිරාවය

"මක්නිසාද මේ දෙවියන්වහන්සේ සදාකල්හිම අපේ දෙවියන්වහන්සේය. උන්වහන්සේ මරණය දක්වා අපට මඟ පෙන්වන සේක." (ගීතාවලිය 48:14)



**ප්‍රේමණීය මිත්‍රයෙනි,**

**අපගේ ස්වාමිවූ විශ්වයේ ගැලවුම්කාර යේසුස් ක්‍රිස්තුස්වහන්සේගේ බලවත් නාමයෙන් ඔබට සුභ පැතුම් ගෙනෙමි.**

ඔබගේ යාච්ඤාව හා උපකාරයන් ඔබ දක්වන නිසා අපි ඔබට ගරු කරමි. ඔබ උදෙසා යාච්ඤා කරමු. ඔබට ස්තුති කරමි.

අපගේ කැඳවීමේ ප්‍රතිරාවය සේවය වෙනුවෙන් ස්වාමින්වහන්සේ කරන්නා වූ අනර්ඝ ආශිර්වාද ගැන අපි දෙවියන්වහන්සේට ස්තුති කරමු. එසේම ස්වාමීන්වහන්සේගේ සම්පූර්ණකමින් උන්වහන්සේ ඔබ සැම දෙනාවම සම්පූර්ණත්වයට ගෙනෙන පිණිස යාච්ඤා කරමු. (ගීතාවලිය 36:8)

අපගේ ස්වාමි වූ යේසුස් ක්‍රිස්තුස්වහන්සේගේ මහත් වූ කරුණාව හා දයාව කරණකොටගෙන අපගේ සේවයේ 54 වන වසරට අප පා තබමු. පසුගිය වසරවල් පුරාම උන්වහන්සේගේ විශ්වාසවන්තකම, දයාව, කරුණාව හා ප්‍රේමය නිසා අපි උන්වහන්සේට ස්තුති කරමු. එලෙසම මේ අවස්ථාවේදී අපගේ සියළුම මිත්‍රයින්, පාඨකයින්, මුළු ලෝ තලයෙහිම සිටින්නා වූ අය අප වෙනුවෙන් යාච්ඤා කරමින්, උදව් උපකාර කරමින් අපගේ අමාරු කාලයේදීත් යහපත් කාලයේදීත් අප හා සමග සිටි අය උදෙසා ස්තුතිවන්ත වෙමු. ඔබගේ ප්‍රේමය, දයාව හා යාච්ඤා නොමැති නම් අපට මෙතරම් දුරක් ඒමට අසීරුය. මෙතරම් දුරක් පැමිණීමට අපට ශක්තියක් වූයේ ඔබයි.

අප හා සමග සේවය කරමින් දෙවියන්වහන්සේ වෙතට ගියාවූ සහෝදර ජී කමලනාදන්, සහෝදර වෝල් ටර් ඩෝසන්, සහෝදර බුක්කල්, සහෝදර ජේ. ආර්. සුන්දර් රාජ්, සහෝදර ජයකුමාර් මහරාජ්, සහෝදර ඩී. ඩබ්ලිව්. දේව කාන්තන්, සහෝදර ආර්. ඒ. ජෙය රාජ් යන අයව අප සිහිපත් කරමු. ඔවුන් අපගේ සේවයේ කොටස්කාරයන් වූ නිසා තවමත් ඔවුන් අගය කරමු.

ඉන්දියාව පුරාම බොහෝ සභාවන් බිහි කරමින් අපගේ සේවය ව්‍යාප්ත කිරීමට අපි බලාපොරොත්තු වෙමු. මෙම 54 වන වසරේදී අපගේ දර්ශනය සම්පූර්ණ කරන පිණිස යාච්ඤා කරන්න.

Covid 19 නිසා Lock Down නිසා පසුගිය වසර වල අපට වැඩිපුර සේවාවන් කිරීමට නොහැකි විය. නමුත් දැන් කාලය පැමිණ තිබෙනවා අප යක්ෂයාගේ බලකොටු බිඳ දමා ශුද්ධාත්මයාණන්වහන්සේගේ පිබිදීම වැගිරෙන්නා වූ දවසට අපි ලංවී සිටිමු.

නේපාල්, බංගලාදේශ, පකිස්ථාන්, ශ්‍රී ලංකා යන රටවල සිටින සෙනඟට අපි දෙවියන්වහන්සේ ගැන තව දුරටත් ප්‍රකාශකිරීමටත් දෙවියන්වහන්සේ ඔවුන් අතර ක්‍රියාකරන පිණිසත් නොකඩවාම යාච්ඤා කරන්න. සිංහාසනයෙහි සිටින දෙවියන්වහන්සේ මේ සියල්ලම පාලනය කරන බව අපි දනිමු.

අප නොකඩවාම ඔබ උදෙසා යාච්ඤා කරමු. දෙවියන්වහන්සේ ඔබට නීරෝගිකමත් දියුණුවත් දෙන සේක. (3 **යොහාන්** 2) දෙවියන්වහන්සේ ඔබට ආශිර්වාද කරන සේක්වා.

**යේසුස් ක්‍රිස්තුස්වහන්සේ තුල ඔබගේ සේවක**

පාස්ටර් සැම් සෙල්වරාජ් සහ ඇලෙක්ස් සැම්සන් සැම්

(+91) 98412 71858 / 98410 71858, E.mail : samselvaraj333@gmail.com



## OUR MISSION POLICY

We should expound and teach the contemporary generation the undiluted teachings of the ancient and early Apostles. It is the need of the hour.

CHIEF EDITOR
Angeline Selvakumari Henry, M.A., M.Ed.
MANAGING EDITOR
Pastor Alex Samson Sam, B.Th., M.Div.
ADMINISTRATION
Bro. N. Prakasam, M.A., General Manager
EDITORIAL BOARD
Sis. Jesy Veena Sam
Sis. Serena Bevin, M.A., M.Phil., B.Ed.
Rev. Dr. K.R. Rajasekaran
Dr. A. Richard Samuel, M.A., Ph.D.
EDITOR, PUBLISHER & PRINTER
Pastor S. SAM SELVA RAJ
Echo of His Call Printers
10, Mohammed Abdullah 2nd Street,
Chepauk, Chennai- 600 005, India.
Phone : (+ 91- 44) 2852 8282, 2852 9293, 2854 7766
Cell : (+91) 98410 71852, 95661 31858
E.mail ID
sam@echoofhiscall.org
biblecor@yahoo.co.in
WEBSITES
www.echoofhiscall.org
www.stpaulsmatriculation.com
YOUTUBE CHANNEL
Echo of His Call

Our Ministries: ECHO OF HIS CALL Monthly Magazines (16 languages) ☼ BIBLECOR - Postal Courses (3 languages) ☼ Online Courses ☼ Theological Correspondence Courses (2 languages) ☼ Church Planting ☼ Nehemiah Bible Colleges ☼ Gospel Printing Press ☼ Great Commission Partners ☼ St. Paul's Matriculation School ☼ Crusades ☼ Community Development

*1 පිටුවෙන්....*

## දෙවියන්වහන්සේ අපගෙන් බලාපොරොත්තු වන්නේ කුමක් ද?

දෙවියන්වහන්සේට අවශ්‍ය වන්නේ අපට මහත් ලෙස ආශිර්වාද කිරීමටයි. ඒ සඳහා උන්වහන්සේ බලාපොරොත්තු වන්නේ අපගේ විශ්වාසවන්තකම හා කීකරුකමයි. අප ගැන දෙවියන්වහන්සේට ඇති බලාපොරොත්තුව සම්බන්ධව අපට තිබෙන්නාවූ අවබෝධය ඉතා අල්පය. ***''අහෝ දෙවියන්වහන්සේගේ ප්‍රඥාවෙන් දැනගැන්මෙන් බහුලත්වය කොපමණ ගැඹුරුද? උන්වහන්සේ විනිශ්චයන් සොයා දැනගැන්මක් උන්වහන්සේගේ මාර්ගයන් තේරුම් ගැනීමත් කොපමණ අමාරුද? එසේය, ස්වාමීන්වහන්සේගේ සිත දැනගත්තේ කවු ද? නොහොත් උන්වහන්සේවට මන්ත්‍රියා වූණේ කවුද? නොහොත් පළමුවෙන් උන්වහන්සේට යමක් දුන්නේ කවුද? දුන්නානම් ඔහුට ප්‍රතිඵල ලැබේ. මක්නිසාද සියල්ල උන්වහන්සේ උදෙසාය. උන්වහන්සේට සදාකල්ම මහිමය වේවා. ආමේන් (රෝම 11:33-36)***

ප්‍රොපේතවර එළියා බලාපොරොත්තු වූයේ කුඩා රොටියකි. නමුත් ශාරෙපත්හි සිටි වැන්දඹු ස්ත්‍රීයට වසර තුනහමාරක කාලයක් පුරාවට තෙල් හා රොටී ලැබුනේය. (1 රාජාවලිය 17:16-18) අපට ලැබෙන්නාවූ ආදායම ඉතා අඩුවීමට පුළුවනි. නමුත් උන්වහන්සේ එයින් කොටසක් අපගෙන් බලාපොරොත්තු වන්නේ අඩුම තරමින් ඔවුන් තමාගේ දසයෙන් කොටස තම සභාවට දෙනු ලබයි කියාය. ***''මාගේ ගෘහයෙහි භෝජන තිබෙන පිණිස තුඹලා ගබඩා ගෙට ඔතු සියල්ල ගෙනවුත් මා විසින් තුඹලාට අහසේ කඳුළු ඇර ඉඩම් මදිවෙන තරම් තුඹලාට ආශිර්වාදයක් වගුරුවා දෙන්නේ නැද්ද කියා එයින් මා සෝදිසි කර බලාපන්න. (මලාකි 3:10)***

ඔබගේ ජීවිතයේ සෑම පැත්තකින්ම ඔබ ඉතා දරුණු සටන් භූමියක සිටිනා විය හැක. එතුලින් මිදීමක් ඔබ බලාපොරොත්තු වනවා විය හැක. ධෛර්‍යයමත් වන්න. දෙවියන්වහන්සේ ඔබගේ පක්ෂයෙහිය. අපගේ අනන්‍යතාවය සම්බන්ධව අපට කිසිඳු පැහැදීමක් නොමැතිව අප කැළඹී සිටිනවා නම් දෙවියන්වහන්සේට අපගේ ජීවිතය තුල ක්‍රියා කිරීමට නොහැකිය. අපගේ අනන්‍යතාවය උදෙසා අප කුමක් කල යුතුද?

### 1. අපගේ තත්ත්වය අප තබා ගත යුතුයි.

අප දෙවියන්වහන්සේගේ දරුවන් නිසා අප මේ ලෝකයෙහි ජීවත්ව සිටියත් අප මේ ලෝකයට අයිති නැත. අපගේ නාගරිකත්වය තිබෙන්නේ ස්වර්ගයෙහිය. *(පිලිප්පි 3:20)* දෙවියන්වහන්සේ ක්‍රිස්තුස් යේසුස් වහන්සේ අපව මළවුන්ගෙන් නැගිටුවා ස්වර්ගීය ස්ථානවල අපව තබා තිබේ. *(එපීස:2:6)* බොහෝ අවස්ථාවන් වලදී අපගේ තත්ත්වය අපට අමතක වෙයි. ක්‍රිස්තුස්වහන්සේ සමග අපට ඇත්තාවූ තත්ත්වය අපට අමතක වෙයි. ක්‍රිස්තුස්වහන්සේ අපට ඇත්තාවූ තත්ත්වය අප ඉතා සුළුවට ගණන් ගනු ලබයි.

අප උදාහරණයක් දෙස බලමු. උසස් නිළධාරියෙක් ඔවුන්ගේ මූලස්ථානයේ සිට තම කාර්යෙහි නිරත වෙයි. ඔහු නිතරම බොහෝ රටවල් වලට ගමන්කරනු ලබන නමුත් ඔහුගේ කාර්යාලයේ ඔහුගේ කාර්යාලය හා පුරවැසිභාවය ඇත්තේ එකම ස්ථානයක පමණි. ඔහු ඔහුගේම රටට අයිති පුද්ගලයකි. ඒ ආකාරයට දෙවියන්වහන්ගේ දරුවෝ මේ ලෝකයේ ඕනෑම රටකට අයිති විය හැකි නමුත් ඔවුන්ගේ ස්ථිර වාසස්ථානය වන්නේ ස්වර්ගරාජ්‍යය පමණි. ඔවුන් මේ ලෝකයට අයිති නැත. අප මේ ලෝකයේ ආගන්තුකයින්ය. අප මෙහි ජීවත් වනුයේ බොහොම ටික කාලයකට පමණි. මේ ලෝකයෙහි අපගේ දවස් සෙවනැල්ලක් මෙන්ය. *(1 **ලේකම්** 29:15)* අප මේ පොළොවේ විදේශකයින්ය කියා ගීතිකාකරු පවසයි. ***(ගීතාවලිය 119:19) ''මාගේ නවාතැන් ගෙයිදී ඔබගේ පනත් මාගේ ගායනා විය'' (ගීතාවලිය 119:54)*** පේතෘස්ද අප මේ ලෝකයේ විසිරී සිටින්නාවූ තෝරාගනු ලැබූවාවූ වන්දනාකරුවන්ය කියා පවසයි. ***(1 පේතෘස් 1:1-2)*** අපගේ කැඳවීම නම්, මෙම සත්‍යතාවය අප අපගේ මනසේ තබාගෙන ජීවත් වීමයි. එසේම අප අපගේ වස්තුව ස්වර්ගයේ රැස්කර තබා තිබිය යුතුයි. ***(මතෙව් 6:19,20)*** අපට ඕනෑම රටක ජීවත්වීමට හා ඕනෑම භාෂාවක් කථා කරනු ලැබීමට. හැකියාව ඇති නමුත් අප ස්වාමීන්වහන්සේගේ රාජ්‍යයට අයිති සෙනඟක්ය කියා මතකයේ තබාගත යුතුය. අප ජීවත් වෙන්නාවූ රට තුළ තිබෙන සංස්කෘතිය හා පුරුදු අපට අනුගමනය කිරීමට පුළුවනි. නුමුත් ඒ හැම දේ තුළින්ම දෙවියන්වහන්සේට ස්තුති පුද කරමින් ජීවත් විය යුතුය. දේව වචනය මෙසේ පවසයි, ***''අපගේ ස්වාමි වූ යේසුස් ක්‍රිස්තුස්වහන්සේගේ නාමයෙන් සියලු දේ ගැන පිය වූ දෙවියන්වහන්සේට නිතරම ස්තුති කරපල්ලා භාර්යාවෙනි, ස්වාමීන්වහන්සේට මෙන් නුඹලාගේ පුරුෂයන්ට යටත්ව සිටපල්ලා'' (එපීස 5:20-22)*** පුරුෂයන්ද ඔබගේ භාර්යාවට ප්‍රේමකල යුතුයි. (එපීස 5:25,28)

අපගේ ජීවිතයේ මුළු හැසිරීමේදී අප ශුද්ධව සිටිය යුතුය. ***(1 පේතෘස් 1:15) ඒ කාලයෙහි අශ්වයන්ගේ මිණිගෙඩිවල : ස්වාමීන්වහන්සේ ශුද්ධය කියා ලියා තිබෙනවා ඇත.....'' (සෙකරියා 14:20) ''ඉශ්‍රායෙල් වනාහි ස්වාමීන් ස්වාමීන්වහන්සේට ශුද්ධකමට උන්වහන්සේගේ අස්වැන්නේ ප්‍රථම ඵලව සිටියේය...'' (යෙරමියා 2:3) ''ස්ත්‍රීන්ගෙන් කිලුටු නූවෝ මොව්හුය. මක්නිසාද මොව්හු බ්‍රහ්මචාරීහුය. බැටළුපැටවාණන් යන තැනට උන්වහන්සේ අනුවයන්නෝ මොව්හුය. මොව්හු දෙවියන්වහන්සේටත් බැටළුපැටවාණන්ටත් නාඹුල් ඵල වන පිණිස මනුෂ්‍යයන් අතරෙන් මිලේටගන්නා ලද්දෝය.'' (එළිදරව් 14: 1)***

අපගේ සියලුම ක්‍රියා වලින් අප තුල තිබෙන ස්වර්ගීක ගතිගුණ අන් අය දැකිය යුතුය. අප එැවින් තත්ත්වය රැකබලා ගත යුතුයි. අන් අය වැරදි කරන ආකාරයට අපට වැරදි කරන්න බැරි ඇයි? කියා අප සමහරවිට අසනු ඇත. අන් අය ක්‍රියා කරන්නාවු ආකාරයට අප ක්‍රියා නොකර මේ ලෝකය තුල ජීවත් වෙන්නේ කෙසේද? කියා අප ඇසීමට හැකිය. වරක් සුන්දර් නැමැති මගේ පාලකතුමා 'අන් අයට කිරීමට පුළුවනි. නමුත් මා කරන්නේ නැහැ'' කියා පවසනු ලැබීය. මා ඒ ආකාරයෙන් ජීවත්වන්නේ නැහැ කියා අධිෂ්ඨානය කරගත යුතුය.

අප සෑම අවස්ථාවේදීම මේ ලෝකයෙන් වෙන්වු ජීවිතයක් ගත කල යුතුය. බොහෝ දෙනා පවසන්නාවු දෙයක් නම් සභාව තුලට පැමිණ ඔහු ලබාගත්තාවු ප්‍රීතිය, ප්‍රේමය, සත්‍යතාවය, රැකියාව තුලින් හෝ ලෝකය තුලින් ලබා ගැනීමට නොහැකිය කියාය. සමහරු ඔවුන්ගේ ව්‍යාපාර කටයුතු කරන අතර දෙවියන්වහන්සේට සේවයද කරති. බොහෝ අප ඔවුන්ගේ ව්‍යාපාර කටයුතු වලට විශ්වාසවන්තව සිටිති. තවත් අය මේ ව්‍යාපාර කටයුතු සහ සේවය යන දෙක වෙනස්ය'' කියා පවසති. නමුත් මේ ආකල්පය වැරදිය. දෙවියන්වහන්සේගේ දරුවන් සෑම අවස්ථාවකදීම ඔවුනගේ පවිත්‍රත්වය රැකබලා ගත යුතුය. ***''අපගේ සේවයට දෝෂ නොපැමිණෙන පිණිස කිසිවකින් බාධාවට කිසි ප්‍රස්ථාවක් නොදී...''*** *(2 කොරින්ති 6:3)*

## අත්දැකීමක් :-

දිනක් මා හට ඉතා ප්‍රසිද්ධ වු දේව දාසයෙක් මුණ ගැසුනි. ඔහු සේවයක් කරන අතර ව්‍යාපාර කටයුත්තක් ද කරනු ලබති. ඔහුගේ ව්‍යාපාරය නම් සංගීත භාණ්ඩ අලෙවි කිරීමයි. මා හට එකෝඩියම් එකක් ලබා ගැනීමට අවශ්‍යව තිබුණි. මෙම පුද්ගලයා මා හට එකෝඩියම් එකක් පෙන්වා ''මෙය ලෝකයේ ඉතාම උසස් කර්මාන්තශාලාවක නිෂ්පාදනය කලාවු භාණ්ඩයක්ය.' කියා පවසනු ලැබීය. පසුව මා මුදල් ගෙවා එය මිලදී ගත්තෙමි. නැවත සතියකට පසු මගේ සේවය සඳහා මුදල් අවශ්‍යතාවය ඇති වූ හෙයින් මා මිලදී ගත් එක නැවත එය අලෙවි කල පුද්ගලයා වෙතට ගෙන ගොස් ඔහුටම අලෙවි කිරීමට සූදානම් වූවා. එවිට එම පුද්ගලයා මෙසේ පවසනු ලැබීය. මේ එකෝඩියම් එක ගන්නේ කවුද? දැන් මේ එකොඩියම් එක වෙළඳපොල තුළ නොමැත. මීට වසර ගණනාවකට මේ සමාගම වසා දමනු ලැබීය. මෙය දැන් හොඳ භාණ්යක් නොවෙයි. නැවත මෙය ඔබගේ ගෙදරට ගෙන යන්න'' කියා පවසනු ලැබීය. අපට මේ ආකාරයෙන් ජීවත් විය නොහැකිය. අප දෙවියන්වහන්සේගෙ දරුවන්ය කියන්නාවූ තත්ත්වයෙන් වෙනස් විය යුතු නැත. කිතුණුවන් ඔවුන් කරන්නාවු රැකියාව තුල ඔවුනගේ ක්‍රියාවන් ඉහළ මට්ටක් තුළ තබාගෙන ජීවත් විය යුතුය.

ඇදහිලිවතුන් සෑම විටකදීම ලෝකයේ ආකාරයට හැඩ නොගැසී ඉතා පවිත්‍ර ජීවිතයක් ගතකල යුතුයි.

## තවත් අත් දැකීමක් :-

වරක් ඉතා ප්‍රසිද්ධ වෛද්‍යවරයෙක් වෙතට මා මගේ මිත්‍රයෙක්ව රැගෙන ගියෙමි. අප ඔහුගේ ප්‍රතිකාර කරන කාමරය වෙතට ගිය විටදී එම කාමරය තුල බොහෝ උපකරණ තිබෙන බව දුටුවෙමි. අප එහි ඇතුලට ගිය විට එහි තිබූ පුටුවෙහි එක් පුද්ගලයෙක් වාඩිවී සිටි අතර තවත් අය එහි කථා කරමින් හා සිනාසෙමින් සිටිනු දක්නට ලැබුණි. එහි සිටි පුද්ගලයා අප හමුවීමට පැමිණි වෛද්‍යවරයාය සිතා අපගේ ප්‍රශ්ණය අප ඔහුට පවසනු ලැබීය. එවිට ඔහු අපට වෙනත් පුද්ගයෙක්ව පෙන්වා ඔහු වෙතට යන ලෙස පවසනු ලැබීය. අප ප්‍රථමයෙන් ඔහු වෛද්‍යවාරයාය කියා සිතා අපගේ ගරුත්වය ලබා දෙනු ලැබූයේ වැරදි පුද්ගලයාටය. අපට දෙවියන්වහ්නසේ දුන් තත්ත්වය හා ගරුත්වය අප ඉතාම ගරුකටයුතුව රැකගත යුතුව ඇත. ***''එබැවින් සහෝදරයෙනි, නුඹලාගේ කැඳවීමද තෝරාගැනීමද ස්ථිරකරගන්නා පිණිස වඩා කඩිසරව ක්‍රියාකරපල්ලා මක්නිසාද නුඹලා මේ දේ කරනවා නම් කිසි කලකත් පැකිලෙන්නේ නැත. මක්නිසාද මෙසේ අපගේ ස්වාමි වූ ගැලවුම්කාරවූ යේසුස් ක්‍රිස්තුසවහන්සේගේ සදාකාල රාජ්‍යයට ඇතුල්වීී නුඹලාට බොහෝසේ දෙනු ලැබේ.''*** *(2 පේත්‍රුස් 1:10-11)*

දෙවියන්වහන්සේ දරුවන් ඔවුන්ට තිබෙන්නාවූ තත්ත්වය ගැන ගෞරවයකින් යුතුව කටයුතු කල යුතුය. දේව දාසයින් හා ඇදහිලිවතුන් ඔවුන්ගේ තත්ත්වය ස්වාමින්වහන්සේ තුළ රැකගත යුතුය. දෙවියන්වහන්සේ අපව මේ ලෝකය තුළ උසස් කරනවා ඇත.

....Contd. to page 6

Pray for NEHEMIAH BIBLE
RESIDENTIAL / EVENING COLLEGE,
Velachery / Chepauk & Santhoshapuram, Chennai.
Medium : Hindi / Tamil
Registered Candidate for Membership
Asia Theological Association (ATA)
Recognised by International Christian Leaders &
Senior Pastors for the past 53 years
Certificate in Theology : One year
Diploma in Theology : Two years
Qualification : 10th Standard & above
Rush for admission!
Contact : The Chairman, Nehemiah Bible College.
10, MOHAMMED ABDULLAH 2ND STREET, CHEPAUK, CHENNAI - 600 005, INDIA.
Phone : (+91-44) 2852 8282, Cell : (+91) 98410 71852 / 95661 31858
E.mail : sam@echoofhiscall.org / Website : www.echoofhiscall.org
✶ ONLINE CLASSES ARE AVAILABLE ✶

GREAT COMMISSION PARTNERS
ECHO OF HIS CALL MINISTRIES
SINCE 1989

# යාච්ඤා පංගුකාර සේවයේ අයට යාච්ඤා ඉල්ලීම්

**බෙදා ගැනීම (ගලාති 6:2)**
**උපකාර කිරීම (රෝම 12:13) සහ**
**පුබුදු කිරීම (2 තිමෝති 1:6)**

## ස්තුති දීම හා ප්‍රසංශා කල යුතු කරුණු

**අගෝ:19-** ධර්මදූත සේවයට පිටත්ව යාම පිණිස කැමැත්තෙන් යාච්ඤා කරන දේව සේවකයන් ගැන ස්තුති කරන්න.

**අගෝ:20-** ධර්මදූත සේවයට පිටත්ව යන්නන් පුහුණු කරන දේව සේවකයන් ගැන ස්තුති කරන්න.

**අගෝ:21-** ධර්මදූත සේවයට අවශ්‍ය මුදල් ආධාර සහ උපකාර කරන්නන් ගැන ස්තුති කරන්න.

**අගෝ:22-** ජීවනයේ වචනය අසන පිණිස යේසුස් වහන්සේ ළඟට පැමිණෙන මනුෂ්‍යයන් ගැන ස්තුති කරන්න.

**අගෝ:23-** භාෂා 16 කින් මුද්‍රණය වී අපට නොමිලයේ ලැබෙන ''ඔහුගේ (යේසුස් වහන්සේගේ) ඇමතුමේ දෝංකාරය'' පුවත්පත් සේවය ගැන ස්තුති කරන්න.

**අගෝ:24-** ''ඔහුගේ (යේසුස්වහන්සේගේ) ඇමතුමේ දෝංකාරය'' පුවත්පත් සේවයේ සියලුම සහකාර කතෘවරුන් ගැන ස්තුති කරන්න.

**අගෝ:25-** මත්ද්‍රව්‍යවලට ඇබ්බැහි වී සිට, පසුව යේසුස්වහන්සේ අඳහාගෙන ඉන් නිදහස් වී සිටින අය ගැන ස්තුති කරන්න

**අගෝ:26-** ස්වාමීන්වහන්සේ කෙරෙහි දේව භය ඇතිව ජීවත්වන කිතුණුවන් ගැන ස්තුති කරන්න.

**අගෝ:27-** යේසුස්වහන්සේ සමඟ ගෝලත්ව සේවයේ යෙදී සිටින වර්තමාන කිතුණු ගෝලයන් ගැන ස්තුති කරන්න.

**අගෝ:28-** සාතන්ගේ අන්ධකාරයේ හිරගෙයින් නිදහස් වී යේසුස්වහන්සේගේ ආලෝකයට පැමිණි මනුෂ්‍යයන් ගැන ස්තුති කරන්න.

**අගෝ:29-** කැපවුන දේව සේවකයන් කිතුණු සභාවට ලබාදීම ගැන දෙවිඳුන්ට ස්තුති කරන්න.

**අගෝ:30-** යාච්ඤා මැදිහත්කරුවන්ගේ සේවය ගැන ස්තුති කරන්න

**අගෝ:31-** යේසුස්වහන්සේ තුළ සාක්ෂිය රැක ගෙන මේ මාසය පුරා පැමිණි ඔබගේ කිතුණු ගමන ගැන ස්තුති කරන්න.

**2022 සැප්තැම්බර් මාසය**

**සැප්:01-** යේසුස්වහන්සේ සමග සහභාගීකම් පවත්වන්ට ලැබුන නව මාසය ගැන ස්තුති කරන්න.

**සැප්:02-** කිතුණු සභාවට මේ මාසය පුරාම මඟපෙන්වන යේසුස්වහන්සේට ස්තුති කරන්න.

**සැප්:03-** ''ඔහුගේ (යේසුස්වහන්සේගේ) ඇමතුමේ දෝංකාරය'' පුවත්පත් සේවයේ නිර්මාතෘ සෑම් සෙල්වරාජ් ඇතුළු පවුලේ අය ගැන ස්තුති කරන්න.

## යාච්ඤා කිරීම් සඳහා කරුණු

**සැප්:04-** නැවුම් ශුද්ධාත්ම ආලේපයක් සෑම දේව සේවකයෙකුටම ලැබෙන පිණිස යාච්ඤා කරන්න.

**සැප්:05-** මේ වසරේදී බයිබල් විද්‍යාවලට ඇතුල්වීමට බලාපොරොත්තුව සිටින සිසු සිසුවියන් ගැන යාච්ඤා කරන්න.

**සැප්:06-** බේබදුකමට වැටී සිටින අය ඉන් නිදහස් වී ගැලවීම ලබාගන්නා පිණිස යාච්ඤා කරන්න.

**සැප්:07-** ග්‍රාමීය ප්‍රදේශ වල සේවය කරන දේව සේවකයන්ගේ ආරක්ෂාව උදෙසා යාච්ඤා කරන්න.

**සැප්:08-** ගුරුවරුන්ගේ ගෞරවනීය සේවය ගැන යාච්ඤා කරන්න.

**සැප්:09-** බොහෝ ආර්ථික ප්‍රශ්න හා දිළිඳුකමින් යුක්තව ජීවත්වන අය උදෙසා යාච්ඤා කරන්න.

**සැප්:10-** ජනාධිපතිතුමා ඇතුළු දේශපාලන නායකයින් ගැන යාච්ඤා කරන්න.

**සැප්:11-** බෝනොවන රෝග වලින් පීඩා විඳින අය ගැන යාච්ඤා කරන්න.

**සැප්:12-** රැකියා විරහිත සියලු දෙනාටම සුදුසු රැකියාවක් ලැබෙන පිණිස යාච්ඤා කරන්න.

**සැප්:13-** මනුෂ්‍යයන් නපුරු මාර්ගවලින් හැරී දෙවියන්වහන්සේ වෙතට පැමිණෙන පිණිස යාච්ඤා කරන්න.

**සැප්:14-** කිතුණුවන්ට ශාරීරික හෝ මානසික පීඩාකරන්නන් එයින් ඉවත්වන පිණිස යාච්ඤා කරන්න.

**සැප්:15-** දේව වචනය අධ්‍යනය කිරීමට ආශාවක් කිතුණුවන්ට ලැබෙන පිණිස යාච්ඤා කරන්න

**සැප්:16-** පීඩා තුළින් ගමන් කරන කිතුණු සභාපලාකවරුන් ගැන යාච්ඤා කරන්න.

**සැප්:17-** අපට පුද්ගලිකව වැරදි කළ අයට සමාව දී යාච්ඤා කරන්න.

**සැප්:18-** ක්‍රිස්තුස් වහන්සේගේ දෙවෙනි ඒමට සෑම කිතුණුවෙක්ම සූදානම්ව සිටින පිණිස යාච්ඤා කරන්න.

4 පිටුවෙන්....

## 2. ගැලවීමේ වස්ත්‍රය

***''මම ස්වාමින්වහන්සේ තුළ බොහෝ සේ ප්‍රීතිවන්නෙමි. මාගේ ආත්මය මාගේ දෙවියන්වහන්සේ තුළ සන්තෝෂවන්නේය. මක්නිසාද මනමාලයා පූජක මකුටයක් දමාගත්තාක් මෙන්ද මනමාලී ඇගේ ආභරණ පැළඳගන්නාක් මෙන්ද උන්වහන්සේව ගැළවීම නැමැති වස්ත්‍ර මට පැළඳවූ සේක. ධර්මිශ්කම නැමැති සළුවද මට පෙරවූ සේක.'' (යෙසායා 61:10)***

යම් වස්ත්‍රයක් ඇඳ සිටීම තුල එම මනුෂ්‍යයා කවුද කියා හඳුනාගැනීමට හැකියාව තිබේ. අප රෝහලකට ගිය විටදී වෛද්‍යවරු හා අනෙකුත් වෛද්‍ය සේවයෙහි නියුතුව සිටින අයට ඔවුන්ගේ රාජකාරී අවස්ථාවේදී ඇඳිමට නියමිත නිල ඇඳුමක් එකිනෙකාට වෙන් වෙන් වශයෙන් දී තිබේ. ඒ ආකාරයට මුරකරුවන්, පිරිසිදු කරන්නන්, සාත්තු සේවිකාවන් හා වෛද්‍යවරුන් යන අයගේ නිල ඇඳුම දුටු විට ඔවුන්ගේ තත්ත්වය හා නිල තලය කුමක් ද කියා අපට හඳුනාගත හැකිය.

මේ ආකාරයට යේසුස් ක්‍රිස්තුස්වහන්සේගේ ලේ වලින් පවිත්‍රත්වය ලැබූ සෑම කෙනාටම ගැලවීමේ වස්ත්‍රයක් ස්වාමින්වහන්සේ දී තිබේ. ***''නුඹලාගේ ජීවිතයේ පළමු හැසිරීම ලෙස රැවටිල්ලේ තෘෂ්ණාවල් අනුව දූෂ්‍යවන්නාවූ පරණ මනුෂ්‍යා පහකරදමා, නුඹලා නුඹලාගේ චිත්තාත්මයෙන් අලුත් කරනු ලැබ සැබෑවේ ධර්මිෂ්කමින්ද ශුද්ධකමින්ද දෙවියන්වහන්සේට සමානව මවනලද්දාවූ අලුත් මනුෂ්‍යයා පැළඳගන්නා ලෙසය.'' (එපීස 4:22-24)***

සමහර අයව අප නොහඳුනනවා විය හැක. නමුත් ඔවුන්ට දුටු විටදී ඔවුන් තුළ තිබෙන ගැලවීමේ ප්‍රීතිය අපට හඳුනාගත හැකිය. අප සභාවේ පමණක් නොව අප රැකියාව කරන්නාවූ අනෙකුත් ස්ථාන වල දෙවියන්වහන්සේගේ දරුවන් කවුද කියා අපට පහසුවෙන් හඳුනාගත හැකිය.

නමුත් මේ කාල වකවානුවේදී බොහෝ අයගේ මුඛයෙන්, ස්වාමිනී, දෙවියන්වහන්සේ ගැලවීම, යාච්ඤාව යන වචන ඇසීමට පවා අසීරුය.සමහරු ශුද්ධ වූ බයිබලය අතේ රැගෙන යාමට හා සභාවට යන විටදී එය ගෙනයාමට ද ලැජ්ජා වන්නාවූ කාලයකි. මේ ආකාර කියමනක් ඇත. එනම්, දෙවියන්වහන්සේගේ ශුද්ධ බයිබලය රැගෙන යන අතත් ස්වාමින්වහන්සේ ඉදිරයෙහි දණ නමන දණහිසක් ඇතිවිට කිසි විටෙක ජීවිතයේ පරාජයට පත්වන්නේ නැහ'' කියාය.

දිනක් මා මගේ පවුලේ අය සමග ආපන ශාලාවකට ගියෙමි. එහිදී අප ආහාර ගැනීමට පෙර එම ආහාර ගැන අප යාච්ඤා කලෙමු. අප යාච්ඤා කර නිමා කල පසුව අප අවට කෑම මේස වල සිටි සමහර කිතුණුවන් අප දෙස බලා අපට සිනාසුනේය. ඔවුන්ගේ ඔවුන්ගේ විහිළු වලින් අපට හැගී ගියේ මෙවැනි කිතුණුවන් තවත් සිටින බවයි. එබැවින් මෙවැනි අපහාස කරන්නාවු අපව අප අමතක කර දැමිය යුතුයි.

අප දෙස බලන්නාවූ අය අප ගැන කුමනාකාරයෙන් සිතුවත් අපගේ කිතුණු සංස්කෘතිය තුල ක්‍රිස්තුස්වහන්සේ සමග තිබෙන්නාවූ ක්‍රියාවන් ඕනෑම ස්ථානයක ක්‍රියාවට දැමීමට අප අතපසු නොකල යුතුයි. අපගේ හදවතේ තිබෙන්නාවූ දේ අපගේ මුහුණේ පිළිබිඹු විය යුතුය.

දිනක් මා මිෂනාරි සේවය සඳහා කැනඩා දේශයට ගිය කල්හි එහි සිටි දෙවියන්වහන්සේගේ දාසයෙක් ඔහුගේ සභාවේ සේවය කරන්නය කියා මට පවසනු ලැබුවේය. මා ඔහුගේ ජීවිතය තුල දෙවියන්වහන්සේගේ ස්වරූපය දුටුවෙමි. දෙවියන්වහන්සේගේ මනුෂ්‍යයා ඇදිය යුත්තේ කෙසේ ද? ඔහු කථාකල යුත්තේ කුමන ආකාරයෙන්ද, දේශනා කරන ආකාරය, සෙනගට තරවටු කරන ආකාරය, ලෝකයෙන් ඇතිවන සියලු තෘෂ්ණා වලට අසු නොවී එයින් ඈත් වෙන්නේ කෙසේ ද කියා ඔහු මට පවසනු ලැබුවේය. නමුත් අද අපට දැකීමට හැකි කාරණයක් වන්නේ මනුෂ්‍යයන් තම රට අත්හැර වෙනත් විදේශීය රටකට ගිය විටදී ඔවුන් ජීවත් වෙනු ලබන්නේ වෙනම ජීවිත රටාවකි.

පාරේ ගමන් කරන්නාවූ වාහන කොපමණ වේගයෙන් ගමන් කරනු ලැබූවත් රථවාහන පොලිසිය එය නවත්වන ලෙසට සංඥාවක් නිකුත් කල විටදි සෑම වාහනයක්ම නතර කල යුතුය. එම රථ වාහන අංශයට දී තිබෙන නිල ඇඳුම නිසා ඕනෑම වාහනයක් නතර කිරීමට ඔවුන්ට බලය තිබේ. අපගේ ජීවිතයට ද ගැලවීමේ වස්ත්‍රයක් දී තිබෙන්නේ සෑම නපුරු දේට විරුද්ධව ක්‍රියා කිරිමට හා එම නපුරු දේ පාලනය කිරීමටය.

***ගීතාවලිය 18:35*** හි මේ ආකාරයට සඳහන් කර ඇත. ***''තවද ඔබගේ ගැලවීම නැමැති පලිහ ඔබ මට දුන්සේක. ඔබගේ දකුණත මා දරුවේය. ඔබගේ මෘදුකම මා උසස් කෙළේය.''*** අප සාමාදානයෙන් ජීවිත් වීමට අවශ්‍ය නම්, දෙවියන්වහන්සේගේ ගැලවීම නමැති පලිහ උසුලාගෙන සිටිය යුතුය.

අප මේ ලෝකය සමගත් යක්ෂයා සමගත් විවිධ ගැටළු වලට මුහුණ දෙන විටදී මෙම ගැලවීමේ වස්ත්‍රය අපව ආරක්‍ෂා කරනු ලබයි. වරක් මගේ මිත්‍රයෙක් තවත් මනුෂ්‍යයෙක් ගැන යම් කාරණ්‍යක් පවසනු පවසනු ලැබීය. එනම් මෙම මනුෂ්‍යයාට අශුද්ධ ආත්මයක් ආවේශ වී බොහෝ පිඩනයට පත්ව ඇත. ඔහුට කිසි කෑමක් ආහාරයට ගැනිමට බැරි අතර ඔහු මනුෂ්‍යයන්ට පහර දීමට ද පටන් ගත්තේය.

මෙමම මනුෂ්‍යයා මගේ මිත්‍රයාගේ යාච්ඤා මෙහෙයට සහභාගි වු අතර ඔහ එම පුද්ගලයාට යාච්ඤා

කල විටදී එම අශුද්ධ ආත්මය මෙසේ පවසනු ලැබීය. එනම් ''මේ මනුෂ්‍යයා ජීවමාන දෙවියන්වහන්සේට නමස්කාර කරන නමුත් ඔහු තම ගමෙහි අශුද්ධ ආත්මයකට කල පූජාවකට සහභාගි වූ නිසා මා ඔහු තුලට පැමිණ ඔහු සමග වාසය කරමි. මට ඔහුට වැඩි හානියක් කිරීමට නොහැක වන්නේ ඔහුගේ දෙමාපියන් ඔහු කැප කල අවස්ථාවේදී ඔහුට අපට විනාශ කිරීමට බැරිය.'' කියා පවසනු ලැබීය.

අප දෙවියන්වහන්සේගේ දරුවන් හැටියට අන්‍ය ආගමික අන්ධකාර බලවේගී ක්‍රියාකාරකම් වලට සහභාගි වීමෙන් වැලකී සිටිය යුතුය. ඔබට දරුවෙක් ලැබුන විටදී ඔහුට හොඳ කිතුණු නමක් යොදන්න. ඒ නමේ තිබෙන ආශිර්වාදය එම දරුවාට ලබෙනවා ඇත. *''බලව මම සොරෙකු මෙන් එමි. නග්නව ඇවිද තමාගේ ලැජ්ජාව මනුෂ්‍යයන්ට නොපෙනෙන පිණිස අවදිව සිට තමාගේ වස්ත්‍ර ආරක්‍ෂා කරගන්නා ආශිර්වාදලද්දෙක්ය. (එළිදරව් 16:14-15)*

## 3. වෙන්කල ජීවිතය ජයග්‍රාහි ජීවිතයකි.

*''එබැවින් නුඹලා ප්‍රිය දරුවන් මෙන් දෙවියන්වහන්සේ අනුව යන්නෝ වෙයල්ලා. ක්‍රිස්තුස්වහන්සේව නුඹලාට ප්‍රේම කොට, මිහිරි සුවඳක් පිණිස දෙවියන්වහන්සේට පූජාවක් ද යාගයක් ද කොට අප වෙනුවට තමන්ම පාවාදුන්නාක් මෙන්ම නුඹලාත් ප්‍රේමයෙන් හැසිරියල්ලා. නුමුත් වේශ්‍යාකමද සියලු ආකාර පවිත්‍රකම හෝ තණ්හාවද නුඹලා අතරේ සඳහන් කරන්ට පමණවත් එපා, එය ශුද්ධවන්තයන්ට නුසුදුසුය. කැතකම්ද මෝඩ කථාද නීච කවටකම් ද යන මේවාත් නුසුදුසුය. ඒවා නොව ස්තුති කිරීම් පවත්වාපල්ලා මක්නිසාද වේශ්‍යාකම් කරන්නෙකුටවත් අපවිත/ තැනැත්තෙකුටවත් රූප වඳින්නෙක් වූ ලෝභයෙකුටවත් ක්‍රිස්තුස්වහන්සේගේද දෙවියන්වහන්සේගෙද රාජ්‍යයෙහි උරුමයක් නොලැබෙන බව නුඹලා සන්තක ලෙස දැන සිටින්නහුය.'' (එපීස 5:1-5)*

සමහර පුද්ගලයින් අද ලෝකය තුළ ජීවත්වෙන්නේ ඔවුන් කැමැති ආකාරයට කථා කරයි. හැසිරෙයි. ජීවත් වෙයි. නමුත් දෙවියන්වහන්සේ කැමැති වන්නේ අප මේ ලෝකය හා සමග එකතු වී ඔවුන් සතුටු කරන ආකාර ජීවිතයක් ගත නොකර අප දෙවියන්වහන්සේ කැමැති වන්නාවූ ජීවිතයක් ගත කල යුතුය. අපගේ ජීවිතය ඒ උදෙසා පූජාකල යුතුයි. නමුත් අද බොහෝ කිතුණුවන් ලෝකයෙන් වෙන් වූ ජීවිතයක් ගත කරන්නේ නැත. එවැනි ජීවිත්යක් ගත කරන්නාවූ අය සමග සම්බන්ධතාවයක් පවත්වන්නන් ගැන දේව වචනය පවසන ආකාරයට ඔවුන්ට ලෝකයෙන් වෙන්වූ ජීවිතයක් ගත කිරීමට අමාරුය. නමුත් අප නිතරම ලෝකයෙන් වෙන්වූ ජීවිතයක් ගත කරනවා නම් අපට ජයග්‍රාහි ජීවිතයක් ගත කල හැකිය.

### (a) දෙවියන්වහන්සේව අනුගමනය කරන්න.

මේ කාල වකවානුව තුලදී බොහෝ කිතුණුවන් දේශපාලනය සම්බන්ධ වී සිටිති. ඔවුන් සැබෑකම තුලත් දෙවියන්වහන්සේගේ නාමයට අපහාස නොවන ලෙසත් ක්‍රියාකරමින් මනුෂ්‍යයන්ට යහපත් වී සේවයක් කරනව නම්, එය ඉතා හොඳ ක්‍රියාවකි. නමුත් එය ඔවුන්ගේ ප්‍රමුඛස්ථානය නම්, ඔවුන්ගේ ජීවිතයේ ප්‍රමුඛස්ථානය දිය යුත්තේ යේසුස්වහන්සේට පමණි. අද සමහර පාලකවරුන් මෙවැනි දේශපාලන ක්‍රියාවලියන්ට සම්බන්ධ වී ඔවුනගේ කාලය හා ජීවිතය නාස්ති කර ගනිති. ඔවුන්ට ලැබෙන මුදල් දේව සේවයට හා ඔවුන්ගේ පවුලට පාවිච්චි කල යුතුයි. එසේ නොමැතිව මෙවැනි අනවශ්‍ය ලෙස දේවල් පාවිච්චි කිරීම ඉතා නුසුදුසු ක්‍රියාවකි. සේවයට කැඳවීම ලැබූ අපි දේශපාලනයට හසු නොවී දෙවියන්වහන්සේව අනුගමනය කල යුතුය.

### (b) ලෝකයේ කාරණාවන්ට හසු නොවන්න.

*''එබැවින් මාගේ දරුව, ක්‍රිස්තුස්වහන්සේ යේසුස්වහන්සේ තුළ තිබෙන අකරුණාවෙන්*

9 වෙනි පිටුවට ...

**Echo of His Call Postal Courses for candidates in India only**

**Pray for** BIBLECOR

We offer Postal Course on Basic Truths of The Bible to new Christians and non-Christians in English – 57 pages, Hindi – 76 pages & Tamil – 96 pages. You will get a course book entitled **New Life – For You!** **After the completion of this course, you will get a certificate. There will be no compulsory fees. You will be blessed!**

The Chairman, Nehemiah Bible College, Echo of His Call, Post Box 2957, CHEPAUK, CHENNAI - 600 005.

Ph.: (044) 2852 8282, 2852 9293, 2854 7766, Cell : 98410 71852, 95661 31858 E.mail : biblecor@yahoo.co.in




# PIT TO PALACE

## පාලු වලකින් මාලිගාවට

"...කියවන්නා තේරුම් ගනීවා...." (මතෙව් 24:15)

# දෙවියන්වහන්සේගේ සේවයට මාගේ කැඳවීම

## My call for God's Work




*S. Sam Selva Raj (Age : 18)*

දෙවියන්වහන්සේගේ බලපෑම් තුලින් මාගේ ජීවිතය වයස අවුරුදු 16-18 දක්වා කාලයන්හිදී දෙවියන්වහන්සේ මාව සෑදීමට පටන් ගත්තේය. මම ඉංග්‍රීසි සහ යතුරු ලියන යන්ත්‍රය පාවිච්චි කරන ආකාරය ඉගෙන ගතිමි. මේ සියල්ල මගේ



*Sis. Sarah Navaroji*



*Pastor Sadhu Yesudas*

වර්තමාන සේවය මහත් උපකාරයක් වෙයි. එසේම මෙම වයස තුළ පූජක දේව දාසයන් (පෙරමග දූතයා) සහ පාස්ටර් සාදු යේසුදාස්, පාස්ටර් ආබ්‍රහම් (ඉන්දියන් පෙන්තකොස්ත සභාව) පාස්ටර් එන්. ජීවානන්දන් (මහිල්ඩි සගරාව) සහ සහෝදරී සාරා නවරෝජි (චෙන්නයි) යන අය ලගින් ඉගෙන ගැනීමටත් ආත්මික සේ වර්ධනය කර ගැනීමටත් ශුද්ධ වූ ජීවිතයක් ගැන ඉගෙන ගැනීමටත් අමාරු වැඩ ඉගෙන ගැනීමටත් ඉවසීම, ප්‍රේමය, යටහත්කම, කැපවීම, කීකරුකම, නිරාහාරව යාච්ඤා කර සේවය කිරීම ආදී දේ ඉගෙන ගත්තෙමි.

මාමේ අයගේ අඩි පාරේ ගමන් කරමින් ස්වර්ගීය කාරණා බුක්ති වින්දෙමි.

මේ කාලය තුලදී පාස්ටර් එස්. දේවදාසන් සමග එකතු වී සේවය කිරීමට මා හට ආරාධනා කලේය. එය මාගේ අනාගතයට හොඳ නිසා ඒ ගැන මා ඉතා සන්තෝෂ වූයෙමි. නුමුත් මාගේ දෙමාපියන් නිහඬ විය. ඒ නිසා මා කුඩා කල සේවයම මා කරගෙන ගියෙමි. මා සේවයට මුළුමනින්ම කැප වී සේවය කළෙමි. උන්වහන්සේ මට මුළුමනින්ම මග පෙන්වන්ය කියා මා උන්වහන්සේව මුණ ගැසුණා.


නමුත් මා හට මාර්ගයක් විවෘත වූයේ නැති නිසා මගේ මිත්‍රයින්ගේ ප්‍රේමය ලැබීමට මා හට කරුණාව ලැබුණි. දෙවියන්වහ්නසේ තුළින් ඉදිරියේදී යමක් කරන්නට ඕනෑ කියන ආශාව මා තුළ තිබූ නිසා දේව භය හා ඇදහිල්ල තුළ මා නොසැලී සිටියෙමි. නුමුත් මා ටිකෙන් ටික මාගේ මිත්‍රයන් සමග එකතු වූ නිසා මගේ මාර්ගය ටිකක් වෙනස් වීමට පටන් ගත්තේය. මගේ දෙමාපියන් හා ඥාතින් කුමක් කල යුතුද කියා නොදැන සිටියේය. නමුත් මේ වෙනස ගැන මගේ මව යාච්ඤා කිරීමට පටන් ගත්තේය.



*Pr. S. Sam Selva Raj & Rev. S. Devadasan*

මෙවැනි අවස්ථාවේදී පූජක දේවදාසන් (අවුරුදු 62) ඔහු අදින්නේ සුදු ඇඳුමක් ය. එක් අතක බයිබලය හා අනෙක් අතේ කුඩයක් තිබුණි. ඔහු මගේ නිවසට පැමිණෙයි කියා මා බලාපොරොත්තු වූයේ නැත. මා එක් වතාවක් ඔහු දැක ඇත්තෙමි. ඔහුව දුටු විට මට මහත් බයක් ඇති විය. මා මගේ මවගේ පිටිපසට වී සිට ගත්තෙමි. පාලකතුමා මා දෙම හා මගේ කාමරය දෙස බැලුවේය. අවසානයේදී ඔහු මට හා මගේ මවට මෙසේ පවසන ලැබීය. ''මේ තරුණයාව දෙවියන්වහන්සේ සේවයට කැඳවයි. හෙට උදෑසන 9.00ට මගේ කාර්යාලයට එන්න''යැයි කියා අපට යාච්ඤා කර ඔහු නැවත ගියේය.

එම වෙලාවේ සිට අපගේ පවුල තුළ මහත් ප්‍රීතියක් ඇති විය. මා මගේ මිත්‍රයින් කීප දෙනාටම එන්න කියා හොඳ කෑම වේලක් සකසා දුනි. මා ඔවුන් සියළු දෙනාම අතහැර ඔවුන්ගෙන් සමුගන්නා බව පැවසුවෙමි. එය ඇසූ ඔවුන් මහත් පුදුමයකට පත්විය. පසුව ඔවුන් මා හට වචනයක්වත් නොපවසා ගියේය.








පසු දින මා පූජක දේවදාසන් සිටි ස්ථානයට ගියෙමි. එදා සිට මා ඔහුත් සමග සේවය කළෙමි. ඔහු ආත්මික පුතෙක් ලෙස සැලකුවේය. මා සෑම ආකාරයෙන්ම යටහත් කමෙන් යුතුව ඔහුට උපකාර කලෙමි. මා ඔහුව අනුගමනය කලෙමි. ඔහු සමග දණගසා ටික වෙලාවක් යාච්ඤා කලෙමි. බයිබලයේ කියවා එය මෙනෙහි කර දෙවියන්වහන්සේ මට පැවසූ දෙය පොතක ලිව්වෙමි.

දෙවියන්වහන්සේ මාව අනාගතයේදී කොයි ආකාරයෙන් පාවිච්චි කරයිද කියා දේව දාසයාට තිබූ මග පෙන් වීම නිසා දෙවියන්වහන්සේගේ ධර්මිෂ්ඨකම තුලත් දෙවියන්වහන්සේ තුළත් විනාශ වන්නාවූ ආත්ම ගැන බරක් ඇතිව යාච්ඤා කිරීමටත් අවංක කමෙන් යාච්ඤා කිරීමටත් දේව වචනය මෙනෙහි කිරීම යන සියල්ලම ඉගැන්වූයේය. එසේම අවංක කමෙන් හා විශ්වාසවන්තකමෙන් ශුද්ධ ජීවිත්යක ගත කරමින් දෙවියනවහන්සේට සේවය කරන්නේ කෙසේ ද කියාත් මුදල් වලට ආශා නොවී දෙවියන්වහන්සේ විශ්වාස කරමින් ගමන් කරනේනේ කෙසේද කියා ඔහු මාව පුහුණු කලේය.

************

*7 පිටුවෙන්....*

***ශක්තිමත් වෙයන්න. ක්‍රිස්තුස් යේසුස්වහන්සේගේ යහපත් භේවායෙකු මෙන් දුක් විඳීමට පංගුකාරයෙක් වෙයන්න. භේවාකම් කරන්නාවූ කිසිවෙක් ඔහු භේවායෙකු මෙන් ලියාගත් අය සතුටු කරන පිණිස මේ ජීවිතයේ කාරණා වලට පටලැවෙන්නේ නැත තවද යමෙක් ක්‍රීඩාවෙහි පොරට යන්නේද ඔහු නියම ලෙස නොයන්නේ නම් ඔටුන්න පැළඳගන්ට ලැබෙන්නේ නැත'' (2 තිමෝති 2:13-5)*** සේවයට කැඳවනු ලැබූ කෙනෙක් තමාගේ පවුලට උපකාර කාරමින් හොඳ සහයෝගයක් දැක්විය යුතුය. ඔහු අනවශ්‍ය දේ වලට එනම්, දේශපාලනය සන්ගම්, සමාජ ශාලා වැනි දේ වලට කාලය වැය නොකර ඔහු ලෝකයෙන් වෙන්වූනාවූ දෙවියන්වහන්සේට ලංව සේවයක් කල යුතුය. ***''ස්වාමිවරුන් දෙදෙනෙකුට සේවයකරන්ට කිසි වැඩකාරයෙකුට නුපුළුවන. මක්නිසාද ඔහු එක්නෙකුට වෛරවන්නේය. අනික් අපට ප්‍රේමවන්නේය. නොහොත් එක්කෙනෙකුට ඇලුම් වන්නේ. අනෙක් අය හෙළා දකින්නේය. දෙවියන්වහන්සේටත් වස්තුවටත් සේවය කරන්ට නුඹලාට බැරිය.'' (ලූක් 16:13)***

## (c) ප්‍රේමයෙන් ඇවිදින්න

***''ක්‍රිස්තුස්වහන්සේ නුඹලාට ප්‍රේමකොට මිහිරි සුවඳක් පිණිස දෙවියන්වහන්සේ පූජාවක් ද යාගයක්ද කොට අප වෙනුවට තමන් පාවාදුන්නාක් මෙන්ම නුඹලාත් ප්‍රේමයෙන් හැසිරියල්ලා'' (එපීස 5:2)*** 1 කොරින්ති 13 වන පරිච්ඡේදයෙහි ප්‍රේමය ගැන කථා කරයි. ***''ප්‍රේමය බොහෝ ඉවසිලිවන්තය, ගුණවන්තය, ප්‍රේමය ඊර්ෂ්‍යාවෙන්නේ නැත. ප්‍රේමය පාරට්ටු කර ගන්නේ නැත. තමාගේම කාරණා සොයන්නේ නැත නපුර ගණන් ගන්නේ නැත. අධර්මිෂ්ඨකමට ප්‍රීති නොවී සැබෑව සමග සමග ප්‍රීතිවන්නේය, සියල්ල දරාගන්නේය. සියල්ල විශ්වාස කරන්නේය. සියල්ල බලාපොරොත්තු වන්නේය. සියල්ල ඉවසන්නේය. (1 කොරින්ති 13:4-7)***

## (d) ධර්මිශ්ඨ වූ ජීවිතයක් තිබිය යුතුයි.

මුදල් තණ්හාව, අපිරිසිදුතාවය වේශ්‍යාකම් ආදී දේ ශුද්ධ වූ සෙනඟට විරුද්ධව කථා නොකල යුතු දෙයකි. මෙවැනි දේවල් ඔවුන්ගේ ජීවිත සමග සම්බන්ධ වීමට නොහැකිය. අපිරිසිදුය. කියා සිතන සෑම දේම ඔවුන්ගේ ජීවිතයට ඇතුලත් නොකර නිතරම දෙවියන්වහන්සේට ප්‍රශංසා කරමින් හරි වූ දේ කල යුතුය. ***''නුමුත් වේශ්‍යාකමද සියලු ආකාර අපවිත්‍රකම හෝ තණ්හාවද නුඹලා අතරේ සඳහන් කරන්ට පමණවත් එපා. එය ශුද්ධවන්තයන්ට නුසුදුසුය. කැතකම්ද මෝඩ කථාද නීච කවටකම්ද යන මේවාත් නුසුදුසුය. ඒවා නොව ස්තුති කිරීම් පවත්වාපල්ලා...'' (එපීස 5:3-4)***

## (e). යේසුස්වහන්සේ සමඟ පංගුකාරයෙක් වන්න.

දේව වචනය පවසනවා අදෛර්‍යමත්කම්, රූප නමස්කාරය, මුදල් වලට ඇති ආශාව වේශ්‍යාකම් යන මෙවැනි දේ කරන අය දේව රාජ්‍යයට ඇතුලත්වන්නේ

RNI NO. TN/SIH/2006/17846

නැත. ''කැතකම්ද මෝඩ කථාව නීච කවටකම් ද යන මේවාත් නුසුදුසුය. ඒවා නොව ස්තුති කිරීම් පවත්වාපල්ලා මක්නිසාද වෛශ්‍යාකම් කරන්නෙකුටවත් අපවිත්‍ර තැනැත්තෙකුටවත් රූප වදින්නෙක වූ ලෝබයෙකුටවත් ක්‍රිස්තුස්වහන්සේගේද, දෙවියන්වහන්සේගේ ද, රාජ්‍යයෙහි උරුමයක් නොලැබෙන බව නුඹලා සන්තක ලෙස දන සිටින්නෙහිය.'' (එපීස 5:4-5)

### (f) ජීවමාන යාගයක්

ශුද්ධ වූ පාවුල්තුමා පවසන්නාවු ආකාරයට අපගේ ශරීරය දෙවියන්වහන්සේට ප්‍රිය ශුද්ධ යාගයක් හැටියට ඔප්පු කරන්නය කියා දේව වචනයෙහි සඳහන්ව ඇත. ***''නුඹලා මේ ලෝකයේ ආකාරයට සමාන නොවී දෙවියන්වහන්සේගෙ කැමැත්ත එනම් යහපත් වූ පිළිගත වූ සම්පූර්ණ වූ දෙය කුමක් ද කියා දන ගන්නා පිණිස සිත අලුත් කර ගැනීමෙන් අන්‍යකාර ඇත්තෝ වෙයල්ලා'' (රෝම 12:2)*** එමනිසා අපගේ මනස අලුත් වැඩියා කරගත යුතුය.

මේ ඉතා අසීරු වීමට පුළුවන. නුමුත් මේ අත්දැකීමට පැමිණි අයට දෙවියන්වහන්සේගේ හඬ නිතරම ඇසෙනවා විය හැක. දෙවියන්වහන්සේගේ මණ්ඩපය මනුෂ්‍යා අතරෙහිය. උන්වහන්සේ එහි වාසය කරන සේක. ඔවුන් උන්වහන්සේගේ සෙනඟ වෙයි. ***''... දෙවියන්වහන්සේ ඔවුන් සමග සිට ඔවුන්ගේ දෙවියන්වහන්සේ වන සේක.'' (එළිදරව් 21:3)*** ස්වාමින්වහන්සේ මේ ලෝකයෙහි ජීවත් වන අයට මෙම අත්දැකීම දෙන සේක.

***


## කැඳවීමේ ප්‍රතිරාවය

සෑම මසකම භාෂා 16 කින් නිකුත් වන සඟරාව, බයිබල් විද්‍යාලය, තැපැල් මාර්ගික බයිබල් පාඩම් මාලාව, සභා රෝපණය, පාසැල් අධ්‍යාපනික සේවය, සුභාරංචි රැස්වීම් මාලා, සම්මේලනය පැවැත්වීම ආදිය.

| | |
|---|---|
| වාර්ෂික දායකත්වය - රු. 100/- | ජීවිත දායකත්වය - රු. 2000/- |

කැඳවීමේ ප්‍රතිරාවය සේවයේ විවිධාකාර සේවාවන් අප පවත්වාගෙන යනු ලබන්නේ ඔබගේ උපකාරයන් හා ස්වේච්ඡාවෙන් ඔබ දෙන සම්මාදන් හා දීමනා කරණකොටගෙනය. ස්වාමීන්වහන්සේ ඔබට මඟපෙන්වන්නාවූ ආකාරයෙන් කැඳවීමේ ප්‍රතිරාවය සේවයට උපකාර කිරීමට ඔබටද හැකිය. ඔබ දෙන්නාවූ උපකාර කරණකොට ගෙන දෙවියන්වහන්සේව නොදන්නාවූ සෙනඟට සුභාරංචිය ප්‍රකාශ කිරීමට උපකාර වෙනවා ඇත.

ඔබට මෙම සඟරාව අවශ්‍ය නම්, කරුණාකර අපට දන්වා එවන්න. ඔබගේ ඊ-මේල් ලිපිනය හා දුරකථන අංකයද, එසේම ඔබගේ ලිපිනය වෙනස් කරනවා නම් එම වෙනස් වූ ලිපිනයද අපට දන්වා එවන්න.

අපගේ වෙබ් අඩවියට ගොස් මෙම භාෂා 16 කින් ඇති සඟරාවන් බලා ගැනීමට ඔබට හැකිවනු ඇත. ඔබගේ ලිපි, යාච්ඤා ඉල්ලීම් සහ ඔබගේ උපකාරයන් පහත ලිපිනයට අප වෙත එවන්න.

කරුණාකර ඔබගේ දුරකථන අංකය, ජංගම දුරකථන අංකය හා ලිපිනය අප වෙත එවන්න.



**ECHO OF HIS CALL**

10, MOHAMMED ABDULLAH 2ND STREET, CHEPAUK, CHENNAI - 600 005, INDIA

PH: (+91-44) 2852 8282, 2852 9293, 2854 7766/ Cell: (+91) 98412 71858, 98410 71852

E.mails: sam@echoofhiscall.org / biblecor@yahoo.co.in

Websites: www.echoofhiscall.org / www.stpaulsmatriculation.com



**Regd. with the Registrar of Newspapers for India under No. TN/SIH/2006/17846**

**Date of Publication: First week of every month**

**Date of Posting : 1st & 2nd of every month**

**Posted at "Egmore RMS / 1 Patrika Channel"**

on 2nd AUGUST 2022.

**If un-delivered please return to:**

**ECHO OF HIS CALL (SINHALA)**

**P.O. Box No. 2957,**

**Chepauk, Chennai - 600 005, INDIA.**

**Phone: (+ 91- 44) 2852 8282, 2852 9293, 2854 7766**


**JESUS LOVES YOU!**

**To**

**GOD BLESS YOU!**


Owned and published by **S. Sam Selva Raj** from New No. 8 & 10, Old No. 18 & 19, Mohammed Abdullah 2nd Street, Chepauk, Chennai-600 005 and printed by him at **Echo of His Call Printers**, New No. 8 & 10, Old No. 18 & 19, Mohammed Abdullah 2nd Street, Chepauk, Chennai-600 005. Editor: **S. Sam Selva Raj.**